# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2250/31 - 2021 ඔක්තෝබර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2021.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ගොනු අංකය : ඒඕ/එම්එන්/01/06/2013.*
*ඉඩම් අමාත්‍යාංශ අංකය :-4-3/4/2013/D/462.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක එම්එන්/73 සවුත්බාර් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, සවුත්බාර් ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද පිඹුරු අංක ''මන් 850'' හි කැබලි අංක 1 සහ 2 ලෙස දැක්වෙන, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 6.6424ක් වූ, සෙකුඩිත්තාඩිම්, වඩලිකුඩල්, වැනිවම් සහ වෙනත් අය සහ යනුවෙන් කොවිල් කාඩු ලෙස හඳුන්වන පහත විස්තර සඳහන් ඉඩම් කොටස.

මූලික පිඹුරු අංක මන් 850

**01. කැබලි අංක 1 සහ 2**

ඉඩමේ නමඃ සෙකුඩිත්තාඩිම්, වඩලිකුඩල්, වැනිවම් සහ වෙනත් අය සහ යනුවෙන් කොවිල් කාඩු; ඉඩමේ විස්තරයඃ ස්ථිර ගොඩනැගිලි 18ක්, අර්ධ ස්ථිර ගොඩනැගිලි 5 ක් සහ වත්ත; හිමිකම් කියන අයඃ රජය; මුල් හිමිකම් කියන අයඃ මුල් හිමිකම් කියන අය නොදනී; ප්‍රමාණයඃ- හෙක්ටයාර් 6.6424.

*හිමිකම් පරීක්ෂණ පවත්වන දිනය සහ ස්ථානය*

ඉහත සඳහන් ඉඩම/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021.11.24 වැනි දින පෙ.ව 10.00 ට මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

G 35160 - 201 (2021/10)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

තව ද 2021.11.17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබාගැනීම වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එම්. පිරතීප්,
ප්‍රාදේශීය ලේකම්,
මන්නාරම නගරය,
මන්නාරම.

2021 ඔක්තෝබර් මස 05 වැනි දින,
මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-54

---

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය:* සීඑච්අයි/එල්එන්ඩී.1/ඒසී/5/71.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය:* 4-3/09/2016/ඩබ්ලිව්එස්/135.

අංක 2224/34 හා 2021.04.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ ප්‍රකාශයෙහි ඉඩම් විස්තරයෙහි 2 ඒ පිටුවෙහි සිංහල භාෂාවෙන් පළ කරන ලද දැන්වීමෙහි කැබලි අක්ෂර බී හි ඉඩමේ ප්‍රමාණය හෙක්. 0.467 යන්න හෙක්. 0.1167 ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

බී. ඩබ්. එම්. එම්. එස්. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම් ,
හලාවත.

2021 ඔක්තෝබර් මස 11 වැනි දින,
හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-55

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.